
# ඇමතුම
# அமதும
# AMATHUMA

Sri Lanka Telecom

Monthly Journal of the Sri Lanka Telecom Employees - December 2007

www.slt.lk



# We wish our readers a peaceful Christmas

and a season full of joy, love & hope.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# BB-ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම අප සමාගමට

Standard & Poor's Rating Services විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම B+ ශ්‍රේණියේ සිට BB- ශ්‍රේණිය දක්වා වන ඉහළ ශ්‍රේණියට උසස් කරන ලදී. එමෙන්ම 2009 වසරේදී පියවීමට නියමිත ඇමරිකන් ඩොලර් මිලියන 100යේ ජාත්‍යනතර බැඳුම්කරයටද ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම B+ ශ්‍රේණියේ සිට BB- ශ්‍රේණිය දක්වා උසස් වීම විශ්වාසනීය සහතිකයකි.

සාමාන්‍යයෙන් රටවල් සහ සමාගම් ලබන ඉහළම ඉලක්කය වන්නේ Sovereign ශ්‍රේණිගත කිරීම් වුවද BB- ශ්‍රේණිය සමාගමකට ඉතාමත් කලාතුරකින් ළඟාවීමට ලැබෙන විශිෂ්ටතම ශ්‍රේණියකි.

'ලෝකයේ ප්‍රමුඛතම මූල්‍ය වෙළඳ පොළ පිළිබඳ තොරතුරු සපයන සමාගමක් වන Standard & Poor's Rating Services විසින් අප සමාගම, පූර්ණ සන්නිවේදන සේවා සැපයුම්කරුවකු ලෙස දියුණුවෙමින් සිටින සමාගමක් ලෙස පිළිගැනීම පිළිබඳව මම එම සමාගමට ස්තුතිවන්ත වන බව ඉතාමත් සතුටින් ප්‍රකාශ කිරීමට කැමතියි. අපි සමාගමක් වශයෙන් මෙම ජයග්‍රහණය පිළිබඳව ආඩම්බරයට පත් වෙනවා. එමෙන්ම ලෝකයේ ශ්‍රේණිගත කිරීම් සඳහා යොමු වීමට තරම් අපගේ මූල්‍ය හැකියාවන් වර්ධනය වෙමින් පවතින බව එයින් ප්‍රදර්ශනය වෙනවා. එමගින් ශ්‍රී ලාංකිකයින්ට විදේශ ලෝක වෙළඳ පොළ සහ බැංකු සමග සම්බන්ධතා පැවැත්වීම සඳහා යොමුවීමේ හැකියාව පවතින බව පෙන්වා දෙන්නක්." මෙවන් ඉහළ ශ්‍රේණියක් හිමිවීම පිළිබඳව අදහස් දැක්වූ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සෝජි ටකහෂි මහතා පැවසීය.

මෙම Standard & Poor's Rating ශ්‍රේණිගත කිරීම් සිදුකිරීමේදී මූලිකවම, ආයතනයක මූල්‍යමය ශක්තිය සහ හැකියාවන් වාර්ෂික සමාලෝචනයකට ලක්කරනු ලබයි. මෙවැනි ඉහළ ශ්‍රේණිගත කිරීමක් සඳහා යොමුවීමේදී සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා අවහිර බාධක පවතින්නා වූ වාතාවරණයකදී වුවද ස්ථාවර මූල්‍ය තත්ත්වයන් පවත්වාගෙන යාමේ හැකියාව සමාගම පිළිබඳව සොයා බැලේ. තවද මෙමඟින් පැහැදිලි වන්නේ, ආයතනික මෙහෙයුම් සඳහා රට තුළ පවතින්නා වූ අවදානම් තත්ත්වය අඩුවී ඇති බව සහ ව්‍යාපාරික පාරිසරික තත්ත්වයන් දියුණු වී ඇති බවත් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම, ආරම්භයේ සිටම පවත්වා ගෙන ආ හිඟ මුදල් ප්‍රමාණය සහ එහි ප්‍රධාන ව්‍යාපාරය තුළින් ලැබෙන මුදල් ප්‍රමාණය අඛණ්ඩව එම තත්ත්වයන්හිම පවත්වාගෙන යන බවයි.

# சர்வதேச தரப்படுத்தலில் எமது நிறுவனத்திற்கு BB-

Standard & Poor's Rating Services என்ற அமைப்பு தேசத்தின் ஒன்றிணைக்கப்பட்ட முன்னணித் தொடர்பாடல் சேவை வழங்குநரான ஸ்ரீலங்கா ரெலிகொம் மீதான அதன் நீண்டகால வெளிநாட்டு நாணய விகிதத்தை 'B+' இல் இருந்து 'BB-'ஆக உயர்த்தியுள்ளது. அத்துடன், 2009 ஆம் ஆண்டில் செலுத்துவதற்கான அமெரிக்க டொலர் 100 மில்லியன் மதிப்புக்கொண்ட பாதுகாப்பற்ற நாணயங்கள் மீதான விகிதத்தையும் அது 'B+' இல் இருந்து 'BB-'யாக உயர்த்தியுள்ளது.

B+ ஆகவுள்ள நாட்டின் வல்லமை சான்ற (Sovereign) விகிதத்துக்கு மேலாக, இத்தகைய சர்வதேச விகிதத்தை இலங்கையில் பெற்றுக்கொண்ட ஒரே ஒரு கம்பனி ஸ்ரீலங்கா ரெலிகொம் ஆகும். வல்லமை சான்ற விகிதம் சாதாரணமாக ஏனைய நாடுகள் எதிர்பார்க்கும் அதிகூடிய விகித மாகும். அத்துடன், கம்பனிகளும் இதனையே எய்த விளைகின்றன. இந்த வகையில் இந் நிலை தனித்துவம் கொண்ட ஒன்றாகும்.

விகிதம் தரமுயர்த்தப்பட்டது குறித்து ஸ்ரீலங்கா ரெலிகொம் பிரதம நிறைவேற்று அதிகாரி ஷோஜி தக்கஹாஷி இவ்வாறு கூறினார்: "நிதிசார் சந்தை பற்றி நுண்ணாய்வறிவு வழங்கும் முன்னணி அமைப்பாகிய Standard & Poor's Rating Services நாம் பூரணத்துவம் பெற்ற ஒன்றிணைக்கப்பட்ட தொடர்பாடல் சேவை வழங்குநராக உயர்வடையுமளவிற்குரிய ஆற்றலைக் கொண்டிருப்பதாக எம்மை அங்கீகரித்துள்ளது கண்டு பெருமையடைகின்றோம். எமது நிதிசார் ஆற்றலின் வகையில் எமது உலக ரீதியான விகிதத்தை தொடர்ந்து நாம் மேம்படுத்திவருவதை எமது சாதனை எடுத்துக்காட்டுவதாக உள்ளது என்பதையிட்டு நாம் பெருமைகொள்ளலாம். இலங்கையர் வெளிநாட்டு நிதியைப் பெற முற்படலாம் என்பதை இது தெளிவாக்கியுள்ளது.

விகிதம் தரமுயர்த்தப்படுத லானது கம்பனியின் நிதிசார் சக்தியையும் ஆற்றலையும் மைய மாகக் கொண்டதுடன் S&Pயின் வருடாந்த ஆய்வினை அடிப்படையாகவும் கொண்டுள்ளது.

அத்துடன் நியாய பூர்வ செயற்பாட்டுச் சூழல் தன்மையானதாக அழுத்தம் இருக்குமிடத்து, அதனுடன் சேர்த்து வெளிநாட்டு நாணய உள்வரவு மீது குறிப்பிடத்தக்க வல்லமை சான்ற தலையீடும் இருப்பதுடன் அதன் வெளிநாட்டு நாணயக் கடப்பாடுகளுக்கு சேவையளிக்க முடியுமென்ற கருத்தை S & P கொண்டிருப்பதனால் இதன் தொடராகவே இந்த விகிதம் பற்றிய செயற்பாடு தொடர்ந்துள்ளது. வல்லமை சான்ற விகிதம் அதன் வெளிநாட்டு நாணயக் கடப்பாடுகள் மீது அவ்வாறு செய்யாவிடினும் இதுவே நிலையாக இருக்குமென்பது

# SLT above the sovereign rating

Standard & Poor's Rating Services, the leading provider of financial market intelligence raised its long-term foreign currency rating on Sri Lanka Telecom, the nation's only integrated communication service provider to 'BB-' from 'B+.' It has also raised the rating on the US$ 100 mn senior unsecured notes due in 2009 to 'BB-' from 'B+.'

This is a major achievement for the SLT as it is the only company in Sri Lanka to have received such an international rating in the country that is notably above the country's sovereign rating, which is a B+. This is a unique position as a sovereign rating is usually the highest other countries as well as companies could aim for.


Speaking on the upgrading of the rating, Shoji Takahashi, CEO, SLT said: "I am very pleased that S&P, a leading provider of financial market intelligence has recognised our potential to grow in order to become a fully integrated communication service provider. We are proud of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

this achievement, as it is also a reflection of how we continue to improve our global rating in terms of our financial capabilities. It clearly demonstrates that Sri Lankan's can go forward for foreign funding offers."

The upgrading of the rating is based on S&P's annual review on the company's financial strengths and capabilities. The criteria involved in the raising of the rate is that in the event of a reasonable operating environment stress scenario, coupled with potential sovereign intervention on foreign currency flows, there must be a relatively material probability that the issue would still be able to service its foreign currency obligations. This is even if the sovereign does not do so on its own foreign currency obligations. It is also a reflection of the improved country risk factors and business environment in which the company operates.

# නගරයෙන් පිටතට ව්‍යාප්ත වන මෙට්‍රෝ ඊතර්නෙට්




Fiber Optic Super Highway Network Connecting any Province of Sri Lanka




කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ සමාගම් පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවයක් වන එක් ස්ථානයක සිට තවත් එක් ස්ථානයකට (VLL) සහ විවිධ ස්ථානවලින් විවිධ ස්ථාන (VPLS) වෙත VPN සේවා හරහා අවහිරතාවයකින් තොරව සිදු කළ හැකි අධිවේගී දත්ත සම්බන්ධතාවයක් සඳහා කෙරුණු දැඩි ඉල්ලුම මත පසුගිය වසරේදී නවීනතම IP සහ MPLC තාක්ෂණය හරහා මෙම මෙට්‍රෝ ඊතර්නෙට් සේවාව ආරම්භ විය.

තඹ රැහැන් ජාලයකින් සම්බන්ධ කෙරුණු legacy data Network තුළින් මෙවැනි අධිවේගී දත්ත සන්නිවේදනය වෙත යොමු වීමේදී අප ආයතනයට යම් යම් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු විණි. මෙය වඩාත් උග්‍ර බවට පත් වූයේ මෙම සේවා සම්බන්ධතාවය කොළඹ පිහිටි ඉතා උස ගොඩනැගිලි වෙත ලබාගැනීම වෙනුවෙන් පැවති ඉල්ලුම සහ ඉහළ සේවාවන් සඳහා වන ගිවිසුම්වල වැඩිවීමත් සමඟිනි.

මෙම ගැටලුවට පිළියමක් ලෙස මෙට්‍රෝ ඊතර්නෙට් ජාලය කොළඹ නාගරික කලාපයේ හැව්ලොක් ටවුම, මරදාන, කොම්පඤ්ඤවීදිය, කොළඹ කොටුව, ලිබර්ටි ප්ලාසා යන අධිවේගී දත්ත සේවා සඳහා වැඩිම ඉල්ලුමක් ඇති ප්‍රදේශ වෙත 10Gbps ධාරිතාවයෙන් යුතු දෘශ්‍ය තන්තු සංදාම කවයක් ඔස්සේ ලබාදී ඇත. තවද කොළඹ නගරයේ, මහල් ගොඩනැගිලි 110ට අධික ප්‍රමාණයක් දෘශ්‍ය තන්තු සංදාම කව 15ක් හරහා Gbps 01ක ධාරිතාවයකින් මෙට්‍රෝ ඊතර්නෙට් ජාලය හා සම්බන්ධ කර ඇත. මෙය මෙට්‍රෝ ඊතර්නෙට් ව්‍යාපෘතියේ පළමු අදියර තුළ සිදු වූ අතර මේ වනවිට මෙට්‍රෝ ඊතර්නෙට් සේවාව එම ගොඩනැගිලි වෙත ලබාදී ඇත.

වැඩි වන පාරිභෝගික ඉල්ලුම අනුව කොළඹින් පිටත ප්‍රදේශයන් සඳහාද මෙහි දෙවන අදියර යටතේ ඊතර්නෙට් සේවාව දැනටමත් ව්‍යාප්ත කර ඇත. ගම්පහ, මීගමුව, හලාවත, කුරුණෑගල, කෑගල්ල, ගල්ගමුව, මාතලේ, මහනුවර, නුවරඑළිය, බදුල්ල, හැටන්, නාවලපිටිය, අවිස්සාවේල්ල, රත්නපුර, කළුතර, මොරටුව, ගල්කිස්ස, අම්බලන්ගොඩ, ගාල්ල, මාතර, කැළණිය, වත්තල, කෝට්ටේ, නුගේගොඩ, රත්මලාන, මහරගම සහ පිළියන්දල වැනි නගර හරහා, දිවයිනේ උතුරු කොටස ආවරණය කරමින් අනුරාධපුරය දක්වාත්, නැගෙනහිර කොටසින් අම්පාර දක්වාත්, දකුණු කොටසින් හම්බන්තොට දක්වාත් ව්‍යාප්ත කර ඇත. පාරිභෝගික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉල්ලුම මත තවත් ප්‍රදේශ වෙත මෙම සේවාව ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වෙයි. මෙට්‍රෝ ඊතර්නෙට් සේවාව Managed Leased Line Network (MLLN) හරහා තවදුරටත් සම්බන්ධ කිරීම මගින් ව්‍යාප්ත කිරීමට සූදානම් කර ඇති අතර එමගින් දිවයින පුරා එකී සේවා ව්‍යාප්ත කිරීමට හැකියාව ලැබෙනු ඇත.

දෘශ්‍ය තන්තු සංදාම සම්බන්ධතාවය තුළින් ලබාදෙන අධිවේගී මෙට්‍රෝ ඊතර්නෙට් සේවාව නම්‍යශීලී ජාලය, උසස් සේවා තත්ත්වය සහ traffic engineering පහසුකම් ඉතා තරගකාරී මිලක් යටතේ ලබාදීමට හැකිවීමෙන් ව්‍යාපාරිකයන්ගේ අපේක්ෂාවන් ඉටුකර දීමට මෙන්ම වැඩි ආදායමක් උපයාදෙමින් සමාගමේ බලාපොරොත්තුද සඵල කිරීමට සමත් වී ඇතැයි VoIP සහ දත්ත සේවා ප්‍රධානී කිත්ති පෙරේරා මහතා පැවසුවේය. මෙම මෙට්‍රෝ ඊතර්නෙට් සේවාව හරහා ඉදිරියේදී තවත් අතුරු ආදායම් මාර්ග විශාල ප්‍රමාණයක් වෙත දොරටු විවර වනු ඇත.

මෙට්‍රෝ ඊතර්නෙට් මගින්, IP-TV, බ්‍රෝඩ්බෑන්ඩ් ඉන්ටර්නෙට් හා VoIP යන සේවා ත්‍රිත්වයම කොළඹ අධි සුඛෝපභෝගී නිවාස සංකීර්ණවල සිටින පාරිභෝගිකයින් වෙත සැපයීමට හැකිවනු ඇත.

# கொழும்புக்கு வெளியே விஸ்தரிக்கப்படும் மெட்றோ ஈதர்நெற் சேவைகள்



ஸ்ரீலங்கா ரெலிகொம்மின் மெட்றோ ஈதர் நெற் சேவைகள் ஓராண்டு காலத்துக்கு முன்னர் ஆரம்பித்து வைக்கப்பட்டன. IPMPLS இற்றைநிலைத் தொழில்நுட்பம் மூலம் எதிர்பார்க்கப்படும் வலையமைப்பு விரிவாற்றல்கள் மற்றும் போக்கு வரத்துப்பொறியியல் அம்சங்களுடன் Point to point தரவுத் தொடர்புகை (VLL) மற்றும் Multipoint to Multipoint VPN சேவைகளை (VPLS) அதிவேகத்தில் ஏற்பாடு செய்வதன் மூலம் கூட்டிணைவு மற்றும் SME வாடிக்கையாளர்களின் தேவைகளை நிறைவேற்றுவதற்காகவே மேற்படி சேவைகள் ஆரம்பிக்கப்பட்டன.

செப்புப் பெறுவழி வலையமைப்பில் நடைமுறைப்படுத்தப்பட்டதான பேற்றுத்தரவு வலையமைப்புடன் தேவைப்பட்ட தரவு, வேகம் மற்றும் வலையமைப்பு விரிவாற்றலைப் பெற்றுக்கொள்வதில் ஸ்ரீலரெ பற்பல சவால்களை எதிர்கொள்ள வேண்டியிருந்தது. இது மிகப்பெரிய பிரச்சினையாக விளங்கியது. அதாவது கொழும்பு மெற்றோ பிரிவில் பெரும்பாலும் உயர்ந்து காணப்படும் கட்டிடங்களாக விளங்கும் வாடிக்கையாளர் தலைமைக்கட்டிடங்களுக்கான பிரதான இணைப்புக்களுக்குரிய சேவை மட்ட உடன்படிக்கை களுக்கான தேவை அதிகரித்து வந்துள்ளது.

இத்தகைய பிரச்சினைகளுக்கு தீர்வு காண்பதற்காகவும் LAN உள்ளக இணைப்புக்கள் மற்றும் VPLS(Layer 2 VPN சேவைகள் போன்ற புதிய சேவைகளை அறிமுகப்படுத்துவதற்காகவும் கொழும்பு மத்தி, கொம்பனித்தெரு, லிபர்டி பிளாஸா, ஹவ்லொக் டவுன் மற்றும் மருதானை ஆகிய அதி உச்ச வேக தரவுச்சேவைகள் தேவைப்படும் பகுதிகளை இணைக்கும் வகையில் 10Gbps வேகத்துடனான Fiber Core Ring வலையமைப்பைக் கொண்டு மெட்றோ ஈதர் நெற் வலையமைப்பு நடைமுறைக்கிடப்பட்டது.

மேலும் 01 Gbps வேகத்தில் 13 Fiber Access Rings இந்த இடங்களிலிருந்து அமுல் செய்யப்பட்டு 110-க்கும் மேற்பட்ட உயர்ந்த கட்டிடங்கள் இணைக்கப்பட்டன. அதாவது கொழும்பில் உள்ள அனேகமான எல்லா தலைமை அலுவலக கட்டிடங்களும் கூட்டிணைவு வாடிக்கையாளர்கள் என்ற வகையில் இவற்றுள் உள்ளடங்கும். இக்கட்டிடங்கள் அனைத்திலும்


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இப்பொழுதுள்ள மெட்றோ ஈதர் நெற் மற்றும் மெட்றோ ஈதர் நெற் சேவைகளின் முதலாவது கட்டம் இதுவாகும்.

கொழும்புக்கு வெளியே உச்ச வேக தரவு சேவைகளின் தேவைகள் அதிகரித்து வருவதால் மெட்றோ ஈதர் நெற் வலையமைப்பு மேற் குறிப்பிட்ட திட்டத்தின் இரண்டாவது திட்டத்தின் கீழ் பிராந்தியங்களுக்கும் விஸ்தரிக்கப்பட்டது.

தற்போது நாட்டின் வடபகுதியில் அனுராதபுரம் வரையிலும் கிழக்குப் பகுதியில் அம்பாறை வரையிலும் தென்பகுதியில் அம்பாந்தோட்டை வரையிலும் இடையிலுமுள்ள கம்பஹா நீர்கொழும்பு குருநாகல் கேகாலை கல்கமுவ, மாத்தளை, கண்டி, நுவரெலியா, பதுளை, ஹட்டன், நாவலப்பிட்டி, அவசாவளை, இரத்தினபுரி, களுத்துறை, மொரட்டுவை, கல்கிசை, அம்பலாங்கொடை, காலி, மாத்தறை, களனி, வத்தளை, கோட்டே, நுகேகொடை, இரத்மலானை, மஹரகம, பிலியந்தலை ஆகிய பிரதான நகரங்களை உள்ளடக்கியதாக இத்திட்டம் அமுல்செய்யப்படுகிறது.

வாடிக்கையாளர்களின் தேவையைப்பொறுத்து மேலும் பல நகரங்கள் விரைவில் இணைக்கப்படும். மெட்றோ ஈதர் நெற் வலையமைப்பு Managed Leased Line வலையமைப்பு (MLLN) மூலம் அதன் சேவைகளை நிறைவேற்றவுள்ளது என்பதுடன் இச்சேவைகளை நாடுமுழுவதும் பெறக்கூடியதாக இருக்கும்.

வலையமைப்பு விரிவாற்றல், தரமுள்ள சேவைகள் மற்றும் போக்குவரத்து பொறியியல் அம்சங்களுடன் போட்டிவகையிலான கட்டணங்களில் கிடைக்கக் கூடிய இழை ஒளியியல் தொடர்புகையை அடிப்படையாகக் கொண்ட உச்ச வேக மெட்றோ ஈதர் நெற் சேவைகள் எமது கூட்டிணைவு வாடிக்கையாளர்கள் பலரைக் கவர்ந்துள்ளன. ஸ்ரீலங்கா ரெலிகொம் அதன் தரவுச்சேவைகளை விற்பனை செய்வதற்கு இதுவே முக்கிய காரணமாக கருதப்படுகின்றது.

தரவு சேவைகள் மற்றும் VOIP பிரிவுத்தலைவர் திரு .கே.ஏ.கித்தி பெரேரா மெட்றோ ஈதர் நெற் சேவைகள் மூலம் 250 மில்லியன் ரூபாவுக்கு மேற்பட்ட வருடாந்த வருமானம் ஏற்கனவே உறுதியாகி விட்டது' என்று கூறினார்.

மேலும் பல சேவைகள் வழங்கப்பட இருக்கின்றன. அத்துடன் எதிர்கால சேவைகள் மூலம் மேலும் பல வழிகளிலும் வருமானம் கிடைக்கவுள்ளது.

கொழும்பில் உள்ள உயர் மாடிக்கட்டிடங்களின் வாடிக்கையாளர்களுக்கு IP-TV அகன்ற பட்டை இணையம் மற்றும் VOIP சேவைகள் போன்ற முத்தரப்புச்சேவைகளை வழங்குவதற்கும் மெட்றோ ஈதர் நெற் பயன்படுத்தப்படும்.

# Metro Ethernet services extended beyond Colombo

The SLT Metro Ethernet services were started a year ago in order to meet the needs of corporate and SME customers by providing very high speed point to point data connectivity (VLL) and Multipoint to Multipoint VPN services (VPLS) with expected network resiliencies and traffic engineering features through the state-of-the-art IP MPLS technology.

SLT was facing a lot of challenges in achieving the required data speed and network resiliency with legacy data network, which was implemented on copper access network in the last mile. This happened to be a very critical issue with increasing demand for Service Level Agreements (SLA) – particularly for their main links to connect customer head quarters buildings, which are mostly the high rising buildings in Colombo Metro.

To address these issues and to introduce new services such as LAN interconnections and VPLS (Layer 2 VPN) services, Metro Ethernet Network was implemented having a Fiber Core Ring Network at a speed of 10Gbps connecting Colombo Central, Slave Island, Liberty Plaza, Havelock Town and Maradana, which are high demanding areas for high speed data services. Further 13 Nos. of Fiber Access Rings at a speed of 01Gbps were implemented from these locations and connected more than 110 high buildings, which included almost all the head quarters buildings of corporate customers in Colombo. This was phase-I of the Metro Ethernet Project and Metro Ethernet Services are now available in all these buildings.

With the increasing demand for high speed data services outside Colombo, Metro Ethernet Network was expanded to regions under the Phase-II of this project. Now it covers up to Anuradhapura in the northern part, Ampara in the eastern part and Hambantota in the southern part of the country covering major cities in between such as Gampaha, Negombo, Chilaw, Kurunegala, Kegalle, Galgamuwa, Matale, Kandy, Nuwara Eliya, Badulla, Hatton, Nawalapitiya, Avissawella, Ratnapura, Kalutara, Moratuwa, Mt Lavinia, Ambalangoda, Galle, Matara, Kelaniya, Wattala, Kotte, Nugegoda, Ratmalana, Maharagama and Piliyandala. More cities are to be connected soon depending on the customer demand. Metro Ethernet Network is set to bridge its services through Managed Leasevd Line Network (MLLN) and these services now can be facilitated island wide.

High speed Metro Ethernet Services based on fiber connectivity with network resiliency, quality of services and traffic engineering features at a very competitive price, have been very attractive to many of our corporate customers and this has been the competitive edge of SLT in selling our Data Services. K A Kiththi Perera, Head of Data Services and VoIP said, "Many more services are to be given and more revenues are to be generated in the future services."

The Metro Ethernet Network will also be used to provide triple play services such as IP-TV, broadband Internet and VoIP services to high end residential customers in Colombo's high rise apartment buildings.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## හෝමාගමට නව ටෙලිෂොප් මධ්‍යස්ථානයක්



ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් හෝමාගම නගරයේදී නව ටෙලිෂොප් මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. මෙම නව ටෙලිෂොප් මධ්‍යස්ථානය ඔස්සේ මීගොඩ, පනාගොඩ, හංවැල්ල, අතුරුගිරිය සහ පාදුක්ක යන නගරවල ශ්‍රී ලංකා ටෙලිකොම් පාරිභෝගිකයින් 25,000 වෙත සේවා සැපයීමට සමාගම බලාපොරොත්තු වෙයි.

පාරිභෝගිකයින් වෙත කාර්යක්ෂම, වේගවත් සහ හිතෛෂී සේවාවක් සැපයීමට හැකිවන ලෙස පුහුණු කාර්යමණ්ඩලයකින් මෙන්ම සියලුම නවීන පහසුකම්වලින්ද සමන්විත වන බව නියෝජ්‍ය නාගරික කලාප ප්‍රධානී ඉමන්ත විජේකෝන් මහතා පැවසිය.

## ගජබා සුබර් ක්‍රොස් 2007ට ශ්‍රී ලංකා ටෙලිකොම් අනුග්‍රහය



පසුගියදා අවසන් වූ 'ගජබා සුපර් ක්‍රොස් තරගාවලිය' සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල්' ප්‍රධාන අනුග්‍රාහකත්වය ලබාදුනි.

මෝටර් රථ ධාවකයන්ගේ දින දර්ශනය තුළ ඉතාමත් ඉහළ වටිනාකමක් ඇති තරගාවලියක් ලෙස අනුරාධපුර සාලියපුර ගජබා මූලස්ථාන මෝටර් රථ ධාවන පවත්වන මෙම තරගාවලිය හැඳින්විය හැකිය. ආබාධිත රණවිරුවන්ගේ සුබසාධනය සහ රෙජිමේන්තු මූලස්ථානයේ පවත්නා අඩුපාඩු සකසා ගැනීම මූලික කරගනිමින් මෙම තරගාවලිය පැවැත්විණි. උතුරු මැද පළාත් තුළ ක්‍රීඩාවක් වශයෙන් මොටර් රථ ධාවනය දියුණු කිරීමෙහිලා ඉමහත් මෙහෙවරක් සිදු කරයි.

මෙවර තරගාවලිය සඳහා තරග කාණ්ඩ 25ක් යටතේ 200කට අධික ක්‍රීඩකයන් ප්‍රමාණයක් මොටර් රථ හා යතුරු පැදි තරග සඳහා ඉදිරිපත් විය.

## තවත් නිවාඩු නිකේතනයක් සීගිරිය ප්‍රදේශයේ



ඓතිහාසික සීගිරි පුරවරයේ සංචාරයේ යෙදෙන ශ්‍රී ලංකා ටෙලිකොම් පාරිභෝගිකයන් වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් නිවාඩු නිකේතනයක් සීගිරි ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත. මෙම නිකේතනය කාමර තුනකින් සමන්විත වන අතර එක් කාමරයක උපරිම වශයෙන් සිව් දෙනෙකුට නවාතැන් ලබාගත හැකියි. ඒ සඳහා දිනකට රුපියල් 400ක් අය කෙරේ. සම්පූර්ණ නිවාඩු නිකේතනය භාවිතා කරන්නේ නම් ළමුන් ඇතුළුව උපරිම වශයෙන් දොළොස් දෙනෙකුට නවාතැන් ගත හැකි අතර ඒ සඳහා රුපියල් 1200ක් අය කෙරේ. සමාගමේ සෑම සාමාජිකයෙකුටම භාවිතා කළ හැකි අන්දමින් මෙම නිවාඩු නිකේතනය පවත්වාගෙන යාමට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස සමාගම සියලු දෙනාගෙන් ඉල්ලා සිටියි.

## මොබිටෙල් වෙතින් 'මොබිටෙල් කැකුළු'




මොබිටෙල් සමාගම, පසුගිය ඔක්තෝම්බර් 1දා යෙදුණු, ජාත්‍යන්තර ළමා දිනයේදී 'මොබිටෙල් කැකුළු' නව විශේෂාංගය හඳුන්වාදෙමින් එවැන්නක් හඳුන්වාදුන් අග්නිදිග ආසියාවේ පළමු ජංගම දුරකථන ක්‍රියාකරුවා බවට පත්විය.

'මොබිටෙල් කැකුළු' (Mobitel Junior) සේවාව අවුරුදු 4ත් 12ත් අතර දරුවන් වෙනුවෙන් හඳුන්වාදෙනු ලැබුවකි. 333 යන අංක, මොබිටෙල් සබඳතාවයක් සහිත දුරකථනයකින් අංකනය කිරීමෙන්, කතා (සඳවතී නැන්දාගේ කතන්දර), සාමාන්‍ය දැනීම (ලෝකයෙන් දැනුම), හාස්‍ය (බෝගල් මාමාගේ වැඩ), සත්තු (සූ එකේ සවාරියක්), යහ පුරුදු (මම හොඳ ළමයෙක්) සහ ගීත (අපි සිංදු කියමු) ආදී තොරතුරු හා විනෝදාස්වාද අංග රැසක් ලබාගත හැකිවෙයි. 333 යන්න අංකනය කළ පසු හඳුන්වාදීමේ සේවාව භාෂා ත්‍රිත්වයෙන් ක්‍රියාත්මක වන අතර ඉන් තමන් කැමති භාෂාවක් ළමුන්ට තෝරාගත හැකි වෙයි. භාවිතා කරන්නන්හට උපරිම වින්දනයක් ලබාදීම සඳහා සියලු සේවා නිරන්තර යාවත්කාලීන කිරීම් සිදු කිරීමට සමාගම කටයුතු යොදා ඇත.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# දුම්රියෙන් ගිය වාර්ෂික චාරිකාව





රත්මලාන බාහිර රෝපණ නඩත්තු මධ්‍යස්ථානය එයට සම්බන්ධ ප්‍රාදේශීය නඩත්තු මධ්‍යස්ථානයන්හි කාර්යමණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සහභාගිත්වයෙන් වාර්ෂික සුහද චාරිකාවක් සංවිධානය කර තිබිණි. මොරටුව සිට හලාවත දක්වා වූ මෙම චාරිකාවේ සුවිශේෂත්වය වන්නේ චාරිකාව දුම්රියෙන් ගමන් කිරීමයි. සියලු දෙනාටම මෙය අපූර්ව අත්දැකීම් වූ අතර එකිනෙකා හඳුනාගැනීමටත් කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමත් මෙහි අරමුණ විය. මොරටුව, පිලියන්දල ආදී සියලු ප්‍රදේශයන්හි සිටින OPMC කාර්ය මණ්ඩලය එක්ව සංවිධානය කළ පළමු චාරිකාවද මෙය වෙයි.

# සෙලින්කෝ ලයිෆ් සමාගමට පූර්ණ සන්නිවේදන විසඳුම්

පසුගියදා සෙලින්කෝ ලයිෆ් සමාගම අප සමාගම සමඟින් ගිවිසුමකට එළැඹුණේ ඔවුන්ගේ දත්ත හා හඬ සන්නිවේදන වෙනුවෙන් පූර්ණ විසඳුම් සපයන්නා වශයෙන් අප සමාගම තෝරා ගනිමිනි. සෙලින්කෝ ලයිෆ්හි දීප ව්‍යාප්ත ජීවිත රක්ෂණ ශාඛා 125ක් ඇතුළුව ශාඛා කාර්යාල 129ක් සම්බන්ධ කරමින් IPVPN ජාලය පදනම් කරගත් විසඳුම් මෙම ගිවිසුමට අනුව ලබාදෙයි. ඒ අනුව IP තාක්ෂණය ඔස්සේ දුරකථන ඇමතුම්, වීඩියෝ, ආරක්ෂිත දත්ත සේවා ආදිය සීමාරහිත සම්බන්ධතාවයක් තුළින් ලබාදෙයි.

තවද මාර්ගගත සේවා, වෙබ් පදනම් කරගත් ප්‍රතිපත්ති කළමනාකරණය, මාර්ගගත ගෙවීම්, මාර්ගගතව ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම, මාර්ගගතව පාරිභෝගික තොරතුරු ලබාදීම, මුදල් හුවමාරු කිරීමේ තොරතුරු ආදිය සමඟින් මාර්ගගත බැංකුකරණ සේවා මෙන්ම ජංගම දුරකථන භාවිතයෙන් කෙටි පණිවිඩ ඔස්සේ රක්ෂණ සේවා ලබාදීම යන පහසුකම් සෙලින්කෝ ලයිෆ් සමාගම වෙත හිමිවෙයි. අප සමාගමේ IDC මධ්‍යස්ථානයෙන් ලබාදෙන සේවා, IP VPN සහ PSTN සම්බන්ධතා ආදිය ඔස්සේ මෙන්ම පුළුල් පරාස මෙට්‍රෝ ඊතර්නෙට් සම්බන්ධතා ඔස්සේ සෙලින්කෝ ලයිෆ් සමාගමේ අනාගත අවශ්‍යතාවයන් සපුරාලීමට කටයුතු යොදා ඇත.

# YCS 2007හිදී යොවුන් පරිගණක හැකියාවන් එළිදැක්වේ



තරුණ පරිගණක විද්‍යාඥයින්ගේ සංගමයේ තරගාවලිය (Young Computer Scientist Competition) හයවන වරටත් පසුගියදා හැටන් නැෂනල් බැංකු ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම තරගාවලියේ ප්‍රධාන අනුග්‍රාහකයා වශයෙන් කටයුතු කරන ලද්දේ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමයි. ශ්‍රී ලංකා මෘදුකාංග කර්මාන්ත කරුවන්ගේ ආයතනය (SLASI) විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනයේ (ICTA) සහයෝ-ගිත්වය ඇතිව මෙම තරගාවලිය සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් වයස අවුරුදු 12-16ත් අතර ප්‍රාථමික අංශයේ සහ වයස අවුරුදු 17-16ත් අතර ජ්‍යෙෂ්ඨ අංශයේ ජයග්‍රාහකයන් වෙනුවෙන් 'SLT Young Computer Scientist of the Year' සම්මාන දෙකක් පිරිනමන ලදී. ජ්‍යෙෂ්ඨ අංශයේ ජයග්‍රහණය හිමිකරගත් ජයග්‍රාහකයා, ආසියා පැසිපික් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික සම්මානය (APICTA) සඳහා තරගවැදීමේ සුදුසුකම හිමි කරගනියි.

වාර්ෂිකව පැවැත්වෙන මෙම තරගාවලියේ අරමුණ වන්නේ පාසල් දරුවන්ගේ පරිගණක හැකියාවන් සඳහා අවස්ථාවක් ලබාදීම, ඔවුන්ගේ දක්ෂතාවයන් වැඩිදියුණු කර ගැනීමට දිරිමත් කිරීම, ඔවුන්ගේ නව සොයා ගැනීම් ඇගයීමට ලක් කිරීම ආදියයි. එසේම නව නිෂ්පාදනයන් ඉදිරිපත් කරන්නන්හට දේශීය හා කලාපීය වශයෙන් ඔවුන්ගේ දක්ෂතා එළිදැක්වීමටද මෙය කදිම අවස්ථාවක් වෙයි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් අප සමාගමේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී ඩී. ඩබ්. ආර්. විජේවීර මහතා සහභාගී විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## සිංහපුර දුදරුවන්ට ප්‍රජා සත්කාරයක්





වෘත්තිය සමිති ක්ෂේත්‍රයට නව අරුතක් එක් කරමින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ විදුලි සංදේශ සේවා නිලධාරීන්ගේ සංගමය විසින් පසුගියදා යුද්ධයෙන් පීඩා විඳින මායිම් ගම්මානයක පාසල් රැසක් වෙනුවෙන් ප්‍රජා සත්කාරයක් සිදු කරන ලදී.

මෙහිදී පොළොන්නරුව වැලිකන්දේ සිංහපුර, දිඹුලාන සහ කන්දේකඩුව යන විදුහල් ත්‍රිත්වයේ දරුදැරියන් වෙනුවෙන් පාසල් නිල ඇඳුම් පොත් පත්, පෑන් පැන්සල් සහ වියළි ආහාර ද්‍රව්‍ය අඩංගු ද්‍රව්‍යමය පාර්සලය බැගින් පරිත්‍යාග කෙරිණි. තවද එහි ආචාර්ය මහත්ම මහත්මීන්ටද, ත්‍යාග පාර්සලය බැගින් පිරිනමන්නට යෙදුණි. මෙම සත් කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ නිලධාරී මහත්ම මහත්මීන්ගේ එක්ලක්ෂ පනස්දාහක පමණ මූල්‍යමය සහ ද්‍රව්‍යමය අධාරද ප්‍රධාන වශයෙන් උපකාරී වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියලුම දෙනාට විදුලි සංදේශ සංගමය කෘතවේදීත්වය පළ කර සිටියි.

## අම්බා රීසර්ච් ලංකා අප හා එක්වෙයි

ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික බාහිර සම්පත් සැපයුම් (Business Process Outsourcing - BPO) සමාගමක් වන සීමාසහිත අම්බා රිසර්ච් ලංකා සමාගම, අප සමාගම සමඟ පසුගියදා අත්වැල් බැඳගන්නා ලදී. ඒ අනුව අප සමාගම විසින් අම්බා රිසර්ච් ලංකා වෙත හඬ, වීඩියෝ සහ දත්ත සේවා ඇතුළත් පූර්ණ සන්නිවේදන විසඳුම් ලබාදෙයි.

ඒ අනුව නවීනතම PABX පහසුකම්, ඇමතුම් සඳහා E1 සම්බන්ධතාවයක්, දත්ත සන්නිවේදන විසඳුම් සහ පුළුල්පරාස ඉන්ටර්නෙට් සම්බන්ධතා ආදිය අම්බා රිසර්ච් ලංකා වෙත ලබාදෙයි. තවද මෙම විසඳුම්වලින් කොළඹ පැතිර ඇති එම සමාගමේ ශාඛා කාර්යාලයන්හි සන්නිවේදන ධාරිතාවය වර්ධනය කිරීමද සිදුවෙයි.

## ஹோமாகமவில் புதிய ரெலிஷொப்

ஸ்ரீலங்கா ரெலிகொம் ஹோமாகமவில் புதிய ரெலிஷொப் ஒன்றை திறந்து வைத்துள்ளது. இந்த ரெலிஷொப் ஹோமாகம நகரின் ஹைலெவல் வீதியில் வாடிக்கையாளர்களுக்கு வாகனத்தரிப்பிட வசதியுடன் கூடிய ஓரிடத்தில் அமைந்துள்ளது. ஹோமாகம, மீகொட, நுகேகொட, ஹன்வல்ல, அத்துருகிரிய மற்றும் பாதுக்க நகரங்களில் உள்ள 25000 வாடிக்கையாளர்களுக்கு இது சேவையளிக்கும்.

ஸ்ரீலங்கா ரெலிகொம் வாடிக்கையாளர்களின் நன்மை கருதி நவீன வசதிகளுடன் அடங்கியதாக இந்த ரெலிஷொப் அமைந்துள்ளது.

பயிற்சி பெற்ற ஊழியர்கள் அங்கு கடமையாற்றுகின்றனர்.

## 'அம்பா றிசேச் லங்கா'வுடன் ஸ்ரீலரெ இணைந்தது

ஸ்ரீலங்கா ரெலிகொம் அம்பா றிசேச் லங்கா லிமிட்டட் (Amba Research Ltd) என்ற பிரபல (Bop) வர்த்தக கம்பனிக்கு குரல்வழி, வீடியோ, தரவுச்சேவைகள் ஆகியன உள்ளிட்ட முழுமையான தீர்வுப் பொதி ஒன்றை வழங்கவிருக்கிறது. நவீன தொழில்நுட்பமான குரல்வழி தொடர்பாடலுக்கான PABX உட்கட்டமைப்பு E 1 தொடர்புகை, தரவுத் தொடல்பாடல் தீர்வு அகன்ற பட்டை இணையத் தொடர்புகை போன்ற பல சேவைகள் இத்தீர்வுப் பொதியில் அடங்கியுள்ளன. கொழும்பிலுள்ள கிளை அலுவலக வலையமைப்புக்கான ஆற்றலை வழங்குவது இத்தீர்வுப் பொதியின் முக்கியத்துவமாகும்.

## மொபிடெல் தென்கிழக்காசியாவில் முதல் தடவையாக அறிமுகம் செய்யும் Kids Portal

ஸ்ரீலங்கா ரெலிகொம் மொபிடெல் சர்வதேச சிறுவர் தினமான அக்டோபர் மாதம் முதலாம் திகதியன்று புதியதொரு kids portal என்ற சிறுவர் பொதியை அறிமுகம் செய்துள்ளது. தெற்காசியாவில் இத்தகைய சேவை ஒன்றை அறிமுகம் செய்யும் முதலாவது mobile கம்பெனி இதுவே என்பது குறிப்பிடத்தக்கது.

மொபிடெல் ஜூனியர் என்ற பெயரிலான இச்சேவை 4 - 12 வயதிற்கிடைப்பட்ட சிறுவர்களுக்கானகுரல் வழிப் பொதியாகும். 333 என்ற இலக்கங்களை அழுத்துவதன் மூலம் கதைகள், பாடல்கள், விகடத் துணுக்குகள் ஆகியவற்றை கேட்டு ரசிப்பதுடன் பொது அறிவு விடயங்கள் மிருகங்கள் பற்றிய தகவல்கள், நற்பழக்கங்கள் ஆகியவற்றை சிறுவர்கள் கேட்டறிந்து கொள்ளவும் முடியும்.

பாடல்களைக் கேட்கும் போது சிறுவர்களும் சேர்ந்து பாடலாம். மும்மொழிகளிலும் இச்சேவை அறிமுகப்படுத்தப்படுவதால் சிறுவர்கள் தாம் விரும்பிய மொழியில் விடயங்களைக் கேட்க முடியும்.சேவையிலுள்ள அனைத்து உள்ளடக்கமும் கேட்போருக்கு சுவாரஸ்யம் தரும் வகையில் அவ்வப்போது புதுப்பிக்கப்படும்.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## சிகிரியாவில் மற்றுமொரு விடுமுறை பங்களா



ஸ்ரீலங்கா ரெலிகொம் ஊழியர்களுக்கென சரித்திரப் பிரசித்தி பெற்ற சீகிரியா நகரில் ஒரு விடுமுறை பங்களா இப்பொழுது கிடைக்கக் கூடியதாகவுள்ளது. கூடிய பட்சம் நான்கு பேர் தங்கக்கூடிய மூன்று அறைகளுக்கு நாளொன்றுக்கு கட்டணமாக 400 ரூபா அறவிடப்படும். பங்களா முழுவதையும் பதிவு செய்ய விரும்புவோரிடம் ரூ. 1200 அறவிடப்படும். குழந்தைகள் உட்பட 12 பேர் அங்கு தங்க முடியும். ஊழியர்களின் நன்மை கருதி இவ்வசதியை சிறப்பாகப் பரிபாலிக்க ஒத்துழைக்குமாறு அங்கு தங்குவோர் வினயமாகக் கேட்டுக் கொள்ளப்படுகின்றார்கள்.

## 'செலிங்கோ லைப்' பெறும் பூரண தொடர்பாடல் தீர்வு




'செலிங்கோ லைவ்' நிறுவனத்திற்கு முழுமையான தரவு மற்றும் குரல்வழித் தொடர்பாடல் தீர்வுப்பொதியொன்றை வழங்குவதற்கான உடன்படிக்கையில் ஸ்ரீலங்கா ரெலிகொம் கைச்சாத்திட்டுள்ளது. நாடெங்கிலுமான பூகோள IP/VPN தீர்வினூடாக 125 ஆயுட் காப்புறுதிக் கிளை வலையமைப்பு உட்பட 129 இடங்களுக்கு பொருத்தில்லாத் தொடர்புகையுடனான IP மேலான குரல்வழி, வீடியோ, முக்கிய தரவுச்சேவைகள் ஆகியன இத்தீர்வில் உள்ளடங்கும்.

செலிங்கோ லைவ் வாடிக்கையாளர்களுக்கு ஒன்லைன் சேவைகள் வாடிக்கையாளரின் வெப் அடிப்படையிலான கொள்கை முகாமைத்துவம், ஒன்லைன் கொடுப்பனவுகள், ஒன்லைன் கொள்கை மேம்படுத்தல், ஒன்லைன் வாடிக்கையாளர் தகவல்கள் மற்றும் ஒன்லைன் வங்கிச்சேவையுடனான கொடுக்கல் வாங்கல் விபரங்கள் எஸ்எம்எஸ் ஊடான மொபைல் மீதான காப்புறுதி சேவைகள் போன்ற மேலும் பல சேவை வழங்கல்களும் இதில் அடங்கும்.

எதிர்காலத்தில் ஆரம்பிக்கப்படவிருக்கும் தரவுத் தொகுப்புக்கான ஸ்ரீலங்கா ரெலிகொம் iDC சேவைகள் புதிய கிளைகளுக்கான IP/VPN மற்றும் PSTN தொடர்புகள் ஆகியவற்றுக்கு ஊடாக ஸ்ரீலங்கா ரெலிகொம்மினால் அதன் எதிர்கால தேவைகளை நிறைவேற்றக் கூடியதாக இருக்கும். இதில் உச்ச அகன்றபட்டை மெட்ரோ ஈதனெற் தொடர்புகையும் உள்ளடக்கப்பட்டுள்ளது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## Gajaba Super Cross போட்டிக்கு அனுசரணை



அனுராதபுரம் சாலியபுரவில் உள்ள இராணுவ முகாமில் நடைபெற்ற **Gajaba Super Cross** நிகழ்வுக்கு ஸ்ரீலங்கா ரெலிகொம், ஸ்ரீலங்கா ரெலிகொம் மொபிடெல் ஆகிய இரு நிறுவனங்களும் அனுசரணை வழங்கியுள்ளன.

மோட்டார் ஓட்டப்போட்டியில் பிரதானமானதெனக் கருதப்படும் இந்நிகழ்வினை 100,000 க்கும் அதிகமானோர் கண்டு களித்தனர். மோட்டார் ஓட்டப்போட்டி, மோட்டார் சைக்கிள் ஓட்டப்போட்டி என 25 நிகழ்வுகள் இடம்பெற்றன. உயிர்த்தியாகம் செய்த இராணுவ வீரர்களின் குடும்பத்தினர், ஊனமுற்ற வீரர்கள் மற்றும் இப்பொழுது சேவையில் ஈடுபட்டிருக்கும் வீரர்களின் சேமநலன்களை மேம்படுத்து முகமாகவும் வட மத்திய மாகாணத்தில் மோட்டார் ஓட்டப்போட்டியை பிரபலப்படுத்தவும் அவசியமான நிதியை சேகரிப்பதே இதன் நோக்கமாகும்.

## இளைஞர்களின் கணனி ஆற்றலை வெளிப்படுத்தும் YCS 2007

6வது இளம் கணனி விஞ்ஞானிப்போட்டி-2007 ஸ்ரீலங்கா ரெலிகொம்மின் பிரதான அனுசரணையுடன் ஹட்டன் நஷனல் வங்கி டவரில் வங்கியின் கேட்போர் கூடத்தில் நடைபெற்றது. மென்பொருள் துறைக்கான இலங்கைச்சங்கம் கல்வி அமைச்சினதும் தகவல் தொடர்பாடல் தொழில்நுட்ப நிறுவனத்தினதும் ஆதரவுடன் இப்போட்டியை நடத்தியது. 12-16 வயதிற்கிடைப்பட்ட கனிஷ்ட இளைஞர்களுக்கும், 17-19 வயதிற்கிடைப்பட்ட சிரேஷ்ட இளைஞர்களுக்கு மிடையே வருடத்தின் ஸ்ரீலங்கா ரெலிகொம் இளம் கணனி விஞ்ஞானி என்ற இந்த இரண்டு வகையிலான போட்டிகளை நடத்தி விருது வழங்கிய பெருமை ஸ்ரீலங்கா ரெலிகொம்முக்கு உண்டு. சிரேஷ்ட இளைஞர்களுக்கான போட்டியில் வெற்றி பெற்ற இளைஞர் ஆசிய பசிபிக் தகவல் தொடர்பாடல் தொழில்நுட்ப போட்டியில் பங்குபற்றுவார். வருடாந்தம் நடத்தப்படும் இப்போட்டி பாடசாலை மாணவர்கள் இளவயதில் அவர்களது கணனி அறிவை விருத்தி செய்வதற்கும், புதியனவற்றைக் கண்டுபிடிப்பதற்கும் கண்டுபிடிப்பாளர்கள் அவர்களது படைப்புகளை உள்ளூரிலும் பிராந்தியங்களிலும் அறியச் செய்வதற்கும் பேருதவியாக இருக்கும். போட்டியின் போது ஸ்ரீலங்கா ரெலிகொம்மின் பிரதம தகவல் தொழில்நுட்ப அதிகாரி டி. டபிள்யூ. ஆர்.விஜேவீர கௌரவ அதிதியாக கலந்து கொண்டார்.

## A new Teleshop at Homagama



SLT opened a new Teleshop at Homagama. The Teleshop is conveniently located in the Homagama town facing the High level Road with vehicle parking facilities for customers. The new Teleshop is expected to serve over 25,000 SLT customers in Homagama, Meegoda, Panagoda, Hanwella, Athurugiriya and Padukka towns. I B Wijekoon, Deputy Regional Head of Metro said that the new teleshop is equipped with all modern facilities and well trained staff to provide a convenient, fast and friendly service to SLT customers.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## SLT enhances business of Ceylinco Life




SLT signed an agreement with Ceylinco Life, providing the company with a total data and voice communication solution. This will include Voice over Internet Protocol (VoIP), video, mission critical data services with seamless connectivity for 129 locations including the 125 life insurance branch network via Internet Protocol/Virtual Private Network (IP/VPN) solution, with an island wide geographical spread.

There is also the offering of more products and services to Ceylinco Life customers such as online services, web based policy management by the customer, online payments, online policy upgrades, online customer information and·transaction details with online banking services and insurance services on mobile via SMS. SLT will be able to serve their future demands through the SLT iDC services for data hosting, more IPVPN and PSTN links for new branches, which will be opened in future as well as high bandwidth metro ethernet connectivity.

## Gajaba super cross sponsored by SLT

Sri Lanka Telecom and Sri Lanka Telecom Mobitel were the main sponsors for the Gajaba Super Cross, which was held at the regiment camp at Saliyapura, Anuradhapura. The event, which is reputed to be one of the main racing events on the motor racing calendar, has been spectated by over 100,000 people and comprises 200 racers competing in 25 events in both motorcar and motorcycling disciplines.The objective of the event was to generate much needed funds to improve the welfare facilities of serving able and disabled soldiers along with families of soldiers who have sacrificed their lives as well as popularising motor racing in the North Central Province.

## Mobitel introduces kids portal for the first time in South East Asia

Sri Lanka Telecom Mobitel, introduced a dynamic new kids portal on October 1, International Children's Day, making it the first mobile company in south Asia to introduce such a service.

Branded 'Mobitel Junior' the service is a voice application package for children aged 4 to 12. By simply dialing 333 kids can gain access to a wide variety of information and entertainment such as stories (sandawathie nandage kathandara), general knowledge (lokayen denuma), jokes (begal maamage weda), animals (zoo eke sawaariyak), good habits (mama honda lamayek) and songs (api sindu kiyamu) they can sing along to. The introduction to the service is trilingual, where children can choose the language they prefer, with the content being mixed from then on. All content on the service is uploaded regularly to provide users with maximum entertainment.

## YCS 2007 exposes computing talent among youth

The sixth Young Computer Scientist Competition 2007 (YCS) was held at the Hatton National Building (HNB) auditorium, at the HNB Tower and SLT was the main sponsor of the event. The Sri Lanka Association for the Software Industry (SLASI) with the support of the Ministry of Education and the Information and Communication Technology Agency (ICTA) conducted the event.

SLT was proud to have provided two trophies entitled 'SLT Young Computer Scientist of the Year,' for the two categories comprising of the junior category for ages 12 to 16 and senior category for ages 17 to 19. The winner of the senior category will participate in the Asia Pacific ICT Awards (APICTA).

Held annually, the event aims to expose computing talent of school children at their early stages as well as encourage them to develop their talents and earn recognition for their innovations. It also helps inventors to showcase their creations both locally and regionally. The guest of honour was D W R Wijeweera, Chief IT Officer, SLT.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## Another holiday bungalow at Sigiriya



A holiday bungalow for use by SLT employees is now available in the historic city of Sigiriya. Three rooms that can accommodate a maximum of four people will be charged at Rs 400 per day, while those wishing to reserve the bungalow as a whole can do so for a charge of Rs 1200. The maximum number of occupants is twelve, including children. Occupants are kindly asked to cooperate in helping to maintain this facility for the benefit of all staff.

## Amila Perera's art on display in Hyderabad



An art exhibition of Amila Perera's (RTOM Nuwara Eliya) was held at the University of Oxford for one week from June 24 to June 30, 2007. The Oxford city itself was the origin of the famous Britsh auto brands, Austin and Morris. The exhibition was open free to the public as well as for the university staff and students. 65 drawings of world's best loved classic cars highlighting major milestones in automobile history were on display, and it has been the first solo exhibition held by a Sri Lankan at the univeristy for its longest history.

The exhibition was held in Hyderabad, India organised by Ministry of Tourism, Andhra Pradesh for the 60th Independence Day Programme. Later, it was again held in Mumbai at the Western India Automobile Association.






## Global Research Company ties up with SLT

Sri Lanka Telecom is to provide a communication solution for voice and internet services to Amba Research Lanka Limited. The solution comprises a state-of-art PABX infrastructure connected to the SLT voice network through a high speed E1 link and Broadband access for internet connectivity. Amba Research is a global organisation specialising in investment research support services to the world capital markets industry.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# Retirements



K Wijewickrama, Customer Care Officer attached to Security retired after 27 years of service.



J K Paranavithana, Telecommunication Technical Officer attached to sound systems retired after 39 years of service.



D R W Marasinghe, Customer Relations Officer attached to Asset Management and Budget retired after 40 years of service.



A N Arandara, Call Centre Officer attached to Call Centre (Operations) retired after 27 years of service.



W M P de Silva, Call Centre Officer attached to Call Centre (Operations) section retired after 28 years of service.



M A K Jinadari, Call Centre Officer attached to the Call Centre – Kandy retired after 26 years of service.



A K M M M Thilakaratna, Marketing Officer attached to the Teleshop – Maharagama retired after 40 years of service.



N S B Gunawardhana, Call Centre Officer attached to the RTOM – Negombo retired after 25 years of service.



D A Weththasinghe, Telecom Assistant attached to Switching retired after 27 years of service.



P W Jayathilaka, Supervisor – Technical attached to the RTOM – Bandarawela retired after 35 years of service.



S M Dharmadasa, Supervisor – Technical attached to OPMC – Uva retired after 34 years of service.



K D A Siriwardhana, Engineer attached to OPMC – Kandy retired after 39 years of service.



T R Fernando, Telecommunication Technical Officer attached to the Training Centre – Welisara retired after 29 years of service.



M C P Cooray, Manager – RTO attached to the RTOM – Kalutara retired after 40 years of service.



A A D M P Pascal, Telecom Assistant attached to the RTOM Kalutara retired after 36 years of service.



W A G L Wickramasinghe, Telecom Assistant attached to Regulatory Matters retired after 29 years of service.

WE WISH THEM ALL THE VERY BEST IN THEIR RETIREMENT

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# Resignations



B S N Perera attached to the Accounting System section resigned after serving for one year and six months.



P A C C Pathigoda attached to the Information Security Section Office resigned after serving for 4 years.



A H M S S Abeysinghe attached to HS – BB network resigned after serving for 6 months.



M R Siriwardena attached to HS – BPR resigned after serving for 2 years.

# In memory of...



B M N Gomis, Telecom Assistant – Technical attached to the RTOM, Chilaw passed away after 22 years of service.



S M T Senevirathna, Computer Operator attached to the RTOM, Anuradhapura passed away after 13 years of service.



K B S Somarathna, Customer Care Officer attached to PABX and Payphone passed away after 27 years of service.

We extend our sympathy and condolences to the family and their loved ones.

Photographs : Ravi Prabath

# ශූන්‍ය දින ආක්‍රමණය

ශූන්‍ය දින ආක්‍රමණය හෝ ඉංග්‍රීසි භාෂාවෙන් කියවෙන පරිදි **Zero Day Attack** යනු පරිගණක පද්ධති ආක්‍රමණ කිරීමට යොදා ගන්නා තාක්ෂණයකි. සාමාන්‍යයෙන් මෙවැනි ආරක්ෂණය සම්බන්ධ දුර්වලතා පිළිබඳ විමසිලිමත්ව, ඒ පිළිබඳව පර්යේෂණ කරමින්, එම දුර්වලතා සොයාගන්නා පාර්ශ්ව දෙකක් සිටියි. එනම්, එම දුර්වලතාවලට විසඳුම් සොයන හා ඒවා මගින් හානිකර ක්‍රියාවන් කරනුයේ කෙසේද යන්න සොයමින් සිටින පාර්ශ්වයන්ය. මෘදුකාංගවල ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකරන ආයතන මෘදුකාංග නිපැයුම්කරුවන් හා කෙතෙක් සමීප සම්බන්ධතා පැවැත්වුවද, හානිකර මෘදුකාංග නිර්මාණය කිරීමේ අරමුණින් ක්‍රියාකරන මෘදුකාංග ශිල්පීන් තනිතනිව යම් යම් දුර්වලතා සොයාග නිමින්, මෘදුකාංග සමාගම් ඒ පිළිබඳ දැනුවත් වීමට පෙර, ඒවා භාවිතයෙන් සිදු කළ හැකි හානිකර ක්‍රියා සඳහා පරිගණක වැඩසටහන් නිර්මාණය කර බෙදාහැරීම සිදු කරයි.




මෙලෙස යම් දුර්වලතාවයක් හෙළිදරව් වීමත්, එය මගහැරීම සඳහා විසඳුම් සොයා ගැනීමටත් ගතවන කාලය දින කිහිපයක සිට සති කිහිපයක් දක්වා විහිදී යයි. මෙලෙස යම් දුර්වලතාවයක් සොයාගෙන පද්ධති පරිපාලකයන් විසින් අදාළ යාවත්කාලීන කිරීම් සිදු කිරීමට ගතවන කාල රාමුව ශූන්‍ය දින **(Zero Day)** ලෙස හඳුන්වයි.

ස්වභාවයෙන්ම මේ ආකාරයේ ආක්‍රමණයන්ගෙන් ආරක්ෂාවීම පරිගණක භාවිතා කරන්නන්හට අසීරු කාර්යයකි. මක්නිසාදයත් මෙවැනි ආක්‍රමණ විශ්වාසවන්ත මාර්ග හරහා පැමිණෙන බැවිනි. ආරක්ෂාකාරී පරිගණක භාවිතය හා සමාන්‍ය දැනීම මෙවැනි ආක්‍රමණයන්ගේ ඉලක්ක බවට පත්වීම මගහැරීමට උපකාරීවනු ඇත. නිසි ලෙස යාවත්කාලීන කළ පරිගණක වෛරස, ආරක්ෂණ මෘදුකාංග මෙවැනි හානිකර වැඩසටහන්වලින් ආරක්ෂා කරදීම සිදු නොකරයි. එහෙත් ඒ සඳහා සුදුසු ලෙස හැඩගස්වා ගත් ආරක්ෂාකාරී මුරකපොළු **(Firewall)** භාවිතා කිරීම මගින් හානිකර වැඩසටහන්වල ක්‍රියාකාරීත්වය නැවැත්විය හැකිය. ආරක්ෂණය සම්බන්ධයෙන් අයහපත් වාර්තා ඇති මෘදුකාංග භාවිතා නොකිරීම හා යාවත්කාලීන කිරීම් නිසිකලට සිදු කිරීමද ආරක්ෂාවීමේ උපාය මාර්ගයකි.

බාහිර ආක්‍රමණයන්ගෙන් ආරක්ෂාවන බව පෙනෙන පරිගණක පද්ධතීන්ද මෙවැනි ශූන්‍ය දින ආක්‍රමනයන්හට භාජනය විය හැකිය. එහෙයින් නිරන්තර නිරීක්ෂණය කිරීම් හා විගණනය කිරීම් මගින් පවතින දුර්වලතා හඳුනාගත හැකිය.




Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# විකෙන් වික ඉදිරියට

තවත් වසරක අවසානය සනිටුහන් කරන මේ අවස්ථාවේදී, අපි අභිබවන චින්තයේ තවත් අලුත් සංකල්පයක් ඔබ වෙත හඳුන්වාදෙන්නෙමු. ඒ, Solution-after-next නැතිනොත් විසඳුමෙන් විසඳුම සංකල්පයයි.

පසුගිය කලාපයේදී අපි සාකච්ඡා කළ අරමුණ සංකල්පය තුළදී අරමුණු විකාශනයේදී විවිධ තල ඔස්සේ අපට අරමුණු ගොනු කරගත හැකි බව ඉගෙන ගත්තා ඔබට මතක ඇති. එසේ අර්ථය හා අධිෂ්ඨානයේ පරාසය වැඩිදියුණු කළ පසු කේන්ද්‍රගත අර්ථය හා අරමුණ හඳුනාගැනීම වැදගත් වෙයි. මෙම කේන්ද්‍රගත අර්-ථය හා අරමුණ අනුව විසඳුම් කරා යාමට අවශ්‍ය අදහස් එක් රැස් කරගත හැකිය.




එක් රැස් කරගත් විසඳුම් පියවර වශයෙන් ගත් කළ එක් පියවරක සිට තවත් පියවරකට ගමන් කිරීමේ හැකියාවක් පවතියි. මෙසේ එක් පියවරක සිට තවත් පියවරකට ගමන් ගැනීමේදී පළමු පියවරට (විසඳුමට) වඩා ඊට ඉහළ/දෙවන පියවරේදී කාලය, පිරිවැය, ප්‍රමාදවීම් අඩු විය යුතුය. එනම් පළමු පියවරට වඩා දෙවැනි පියවරේදී වර්ධනයක් අත්පත් කරගත යුතුයි. එසේ රැස් කරගත් විසඳුම් අතර දැනට ක්‍රියාත්මක කළ විසඳුම් තිබිය හැකිය. රැස් කරගත් විසඳුම්ව තුළ පර්යේෂණ හා සංවර්ධනයන් තුළින් තවදුරටත් දියුණු කළ හැකි ඒවා තිබෙනු ඇත. මේ ආකාරයෙන් ක්‍රම ක්‍රමයෙන් අප විසඳුම් ගොනු ගත හොත් අවසන් වශයෙන් අප ළඟාවන්නේ කේන්ද්‍රගත නිරපේක්ෂ විසඳුමකටයි. එහිදී, ප්‍රමාදවීමක්, කාලය වැයවීමක්, පිරිවැයක් නොතිබිය නොහැක. නිරපේක්ෂ විසඳුම තාත්විකව ළඟා කරගැනීම ප්‍රායෝගික නොවුණත්, එම විසඳුම් සිහියේ තබාගෙන අනාගත විසඳුම් සැලසුම් කිරීම තුළින් අනාගතය තුළට නිවැරදි මාර්ගය ඔස්සේ පිවිසිය හැකිය. විසඳුම් 101 තිබුණත් එක් සරල විසඳුමක් තුළින් විසඳුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර පියවරින් පියවර ඉදිරියට ගමන් කළ යුතුය.

# படிப் படியாக முன்செல்ல

BREAKTHROUGH THINKING

மற்றுமொரு புத்தாண்டு மலரும் இவ்வேளையில் தடை மீறு சிந்தனை பற்றி மற்றுமொரு புதிய கோட்பாட்டினை அறிமுகப்படுத்தவுள்ளோம். அதனை Solution - after - next என்று ஆங்கிலத்தில் குறிப்பிடுவார்கள். நாமோ தீர்வினுள் தீர்வு என்று கொள்ளலாம். சென்ற இதழில் நோக்கம் பற்றிய கோட்பாட்டினுள்ளே நோக்கத்தை விரிவுபடுத்தும் போது பல்வேறு படிநிலைகளில் எமக்கு நோக்கத்தை தெளிவுப்படுத்த முடியுமெனக் கற்றுக் கொண்டோம். இது தொடர்பில் கருத்தறிந்து கொண்ட பின்னர் அதன் மையக்கருத்தையும், அர்த்தத்தையும் நோக்கத்தையும் அடையாளம் காண்பது முக்கியம். இவ்விதம் தீர்வினை நோக்கிச் செல்வதற்கான வேண்டிய அவதானிப்புக்களை ஒன்று சேர்க்க முடியும்.

அவ்வாறு ஒன்று சேர்க்கப்பட்ட தீர்வுகளை கவனிக்குமிடத்து ஒரு படி நிலையிலிருந்து மற்றொரு படி நிலைக்கு செல்ல முடியும். இவ்வாறு ஒரு படிநிலையிலிருந்து மற்றொரு படி நிலைக்குச் செல்கையில் முதலாவது படி நிலைக்கு மேலாக 2வது படி நிலையின் போது கால தாமதம் மற்றும் செலவும் குறைந்துவிடும். அதாவது முதலாவது படிநிலைக்கு அப்பால் 2வது படிநிலை முன்னேற்றகரமாக இருத்தல் வேண்டும். அவ்வாறு ஒன்று சேர்க்கப்பட்ட தீர்வுகளில் தற்பொழுது செயற்படுத்தக்கூடிய ஒரு தீர்வினைக் காணமுடியும். ஒன்று சேர்க்கப்பட்ட தீர்வுகளை ஆராய்ந்து விருத்தி செய்வதன் மூலம் மேலும் முன்னேற்றம் ஏற்படுவதை அவதானிக்கலாம். இவ்வாறு படிப்படியாக நாம் தீர்வுகளைத் தேடினால் இறுதியில் எமக்கு கிடைப்பது பிரதானமாகக் கருதப்படும் தீர்வாகும். இதற்கு கால தாமதம் இருத்தலாகாது. சரியான தீர்வுக்கு வருவது நடைமுறை சாத்தியமாகாதுவிடின் அதனை நினைவிற்கொண்டு எதிர்காலத் திட்டங்களை உருவாக்கும் பொழுது தவறின்றி மார்க்கத்தைக் காணமுடியும். தீர்வுகள் 101 இருப்பினும் ஒரு எளிமையான தீர்வுக்குள் தீர்வுகளை செயற்படுத்த ஆரம்பித்து, படியாக முன்செல்ல வேண்டும்.

# Happy Birthday



M F Ashfa Hasmath, daughter of M S M Faizar, attached to the call centre, SLT headquarters and Banu Faizar celebrated her first birthday on September 10, 2007.



K Vihanga Himansi, daughter of K Thushara attached to the Workshop, Welikada and W P P M Sajeewani celebrated her first birthday on October 11, 2007.



Anushika Subramaniyam, daughter of Vimala Subramaniyam attached to the Kalmunai branch of SLT celebrated her fourth birthday on October 13, 2007.



A Alfar Ahamed, Son of C M Anzar and Hairiya attached to the OPMC, Batticaloa celebrated his first birthday on October 28, 2007.



A C N Sarada Curuge, son of A C B Sanjeewa attached to RTOM Office Anuradhapura celebrated his first birthday on November 22, 2007.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පන්හිඬ

## ගුණමකු මිනිසුන්

සිටියා කලක්
එක වහළක් එක සෙවනේ
කෙරුවා සෙතක්
දියුණුව සඳහා සැමගේ
සිටියා එකෙක්
උසුලන්නට බැරි වූ එදේ
සැලසුම් කළා
කරනට ඒ අපවාදේ
කරනා දේ කියා මිස ඒ අයුරින්
එකතු කළා
රෑකඩ වූ කිහිපදෙනක්
අමතක කළා
කරනා වූ සියලු උදව්
ආවා අමන ගති
සිත තුළ පැල පදියම්
සිනාසුනත් විලිස්සා දත්වහලත්
මිනිසෙකු නොවේ
සිව්පා ගති ඇත්තෙක්
දුන්නොත් තිරිසනෙකුට
කවදා හෝ බත් වේලක්
වලිගය වනයි
මගතොටදී දුටුවොතින්
එවැනි වූ ගුණකමක් නැති
මේ මිසදිටුවන්
කොහේ යයිද
මරණින් පසු මෙවැනි උන්?

කරුණාපාල අලුත්ගම
අනුරාධපුර

## දන්වමු සතුටින!

අන්න... බලන්... ගොඩ
ආම්... බලන්... ගොඩ
ටෙලිකොම් ළදැරිය
යොවුන් වියට පත්
වීම නිමිති කොට

ටෙලිකොම් මොබිටෙල්
බිල්පත් ගෙවුමට
ඒ. ඩී. එස්. එල්.
ඩේටා ලිසිං
සී. ඩී. එම්. ඒ.
සේවා සැපයුම

පහසු ගෙවීම් මත
සහනදායී ලෙස
ඔබහට රිසි සේ
එකම පියසකින්
ඔබ සතු කර දෙන

ටෙලිෆෝන් බිල්පත්
මධ්‍යස්ථානය
බිනර මහේ
දාහත්වන ගුරු දින
විවෘත කළ වග
දන්වමු සතුටින!

විජයදාස අහංගමගේ
අම්බලන්ගොඩ

## සමුගැනීම

ආදරණීය පියාණෙනි,
බුද්ධියෙන් පරිණතව
නියමුවෙකු ලෙසින් ඔබ
නොතලමින් සියලු සිත්
එළිකළේ ගමන් මග
පියාණෙනි ඔබ අපගේ

පෙර ගමගින් ගමන් කර
පෙන්වමින් ඉදිරි මග
එකලෙසින් ඉටු කළා
නංවමින් ජය කෙහෙළි
සතුටින්ම ඔබෙ මෙහෙය

තව තවත් දිරිමත්ව
යන සියලු මාවතම
විවරවී සිතු ලෙසින්
පලඳින්න ජය කිරුළු
පතන්නෙමි හැමවිටම...

හේමා කරුණාසේකර
කුරුණෑගල

(වයඹ උතුරු මැද පලාත් ප්‍රධානි යූ. එම්. එල්. ජයකොඩි මහතා උසස්වීමක් ලබා 2007. 09. 07 දින ප්‍රධාන කාර්යාලයට යෑම වෙනුවෙනි.)

## සසර සැරි සරන තුරු

පන්හිදෙක තුඩු අගින්
නොලියවුණු කෘතිය මම
ඔබ සිතු හැටි හරිය
ලියා අවසන් කරමි එය
මියෙන්නට පෙරාතුව

එම්. ඒ. විජයානන්ද
ගාල්ල

## (අ) හිමි

සඳුට හිමි තරු කැටයි
හිරුට හිමි සියපතයි
මලට හිමි බඹරිඳුයි
මට අහිමි ඔබවමයි...

තුළනි සුබෝධා හෙට්ටිආරච්චි
වත්තල

සංස්කරණය:
භාෂා හා සාහිත්‍ය අනුකමිටුව, ශ්‍රී ලංකා ටෙලිකොම් සංස්කෘතික සංගමය.

இந்தப் பக்கத்தில் பிரசுரிக்க, உங்கள் ஆக்கங்களையும் எங்களுக்கு அனுப்பிவையுங்கள்.
Please send in your creative writing contributions to this page.

# සිනාසලන හඬින් කන් පිනවන ශ්‍රී ලංකා අළු දෙමලිච්චා



මෙරටට පමණක් ආවේණික තවත් පක්ෂියෙක් ලෙස ශ්‍රී ලංකා අළු දෙමලිච්චා (Sri Lanka Ashy-headed Laughing Thrush/ Ashy-headed Bubbler) හැඳින්විය හැකිය.

සෙ. මී. 25ක තරම් ප්‍රමාණයේ සිරුරකට හිමිකම් කියන අළු දෙමලිච්චාගේ හිස අළු පැහැයෙන් යුතු වන අතර උඩුකයේ සෙසු කොටස් තද රතුවන් දුඹුරු පැහැයෙන් සමන්විත වෙයි. හොට සහ කකුල් අළු පැහැයට හිරු කළු පැහැයෙන් සමන්විතය.

පහත රට තෙත් කලාපයේ සහ කඳුරට පැතිරීමක් ඇති අතර කැලෑවල වැඩි වශයෙන් ගැවසේ. රැළක් වශයෙන් හැසිරීමට වැඩි කැමැත්තක් දක්වන අළු දෙමලිච්චා, වැඩි වශයෙන්ම කැලෑවල පොළොවේ කොළරොඩු එහා මෙහා කරමින් ආහාර සොයා ගනියි. බුදින රැළෙහි ගමන් කරතත් ඔවුහු බොහෝ විට සිට රටා සමයේදී කුරුල්ලන්ගෙන් සැදුණු රැළක්ම ගමන් කරයි. සිනාසෙන හඬට සමාන නාදයක් අළු දෙමලිච්චාට උරුමය.

අළු දෙමලිච්චන්ගේ සුවැදි සමය අවුරුද්දේ මුල් භාගය වේ යැයි සොයාගෙන ඇති තොරතුරු අනුව අනුමාන කළ හැකිය.

කොළ රොඩුවලින් සහ කෝටුවලින් යුත් නොගැඹුරු ඇරුණු කූඩුවකට හිමිකම් කියන අළු දෙමලිච්චා එය ගසේ කරුවක් මත සාදන බවත් කූඩුව සෑදීමේදී යුවළ එක්වී කූඩුව සාදන බවත් සොයාගෙන ඇත.

දෙමලිච්චාගේ තරම් කුඩා වූ ප්‍රමාණයේ වන අළු දෙමලිච්චාගේ බිත්තර නිල් පැහැයෙන් යුතු වෙයි.

විශේෂ ස්තුතිය:
ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂි විද්‍යාකවය
*(FOGSL)*
චිත්‍ර සටහන: කැළුම් ගුණසේකර

**Published By:** Corporate Relations Section, Sri Lanka Telecom, Level 1, CTO Building, Lotus Road, Colombo 01. Tel: 2446741, Fax: 2441371 Email: amathuma@slt.com.lk
**Edited By:** Jagath Dheerasekara, Vajira Hapuhinna
**Photography:** Sisira Gintotage
**Produced By:** BT Options

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org